<u>**චර්යා ධර්ම සංග්‍රහය**</u>

<u>**ශ්‍රිලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව**</u>

<u>**නිකුත් කළ දිනය 2026 මාර්තු 01**</u>

## 1. හැඳින්වීම

1.1 ශ්‍රිලංකා **වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව** එහි සියලුම මෙහෙයුම්, අන්තර්ක්‍රියා සහ ප්‍රසම්පාදන වලදී , විනය සහ වෘත්තීයභාවය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට කැපවී සිටී. මෙම චර්යාධර්ම සංග්‍රහය මගින් සියලුම වෙරළ ආරක්ෂක පුද්ගලයින් ඇතුළු ශ්‍රිලංකා **වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු** කාර්ය මණ්ඩලයේ අපේක්ෂිත හැසිරීම සහ වගකීම් දක්වා ඇත.

1.2 මෙම චර්යාධර්ම සංග්‍රහය, සදාචාරාත්මක තීරණ ගැනීම, සහතික කිරීම, දූෂණය වැළැක්වීම සහ ශ්‍රිලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව කෙරෙහි මහජන විශ්වාසය ප්‍රවර්ධනය කිරීම සඳහා වන මූලධර්ම මාර්ගෝපදේශක රාමුව ලෙස ක්‍රියා කරයි.

## 2. දැක්ම

2.1 සාමකාමී සමුද්‍රීය පරිසරයක් තුලින් ජාතික සුභ සිද්ධිය ආරක්ෂා කිරීම.

## 3. මෙහෙවර

3.1 **ශ්‍රිලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අරමුණ වන්නේ සමුද්‍රීය කලාපයේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, පවිත්‍රතාවය සහතික කොට බලාත්මක නීතිය ක්‍රියාත්මක කිරීම වේ. සමුද්‍රීය ජෛව විවිධත්වය කළමනාකරණයට සහායවී ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වනු ලබන ව්‍යසනයන්හිදී සිදුවන්නා වූ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමද අපගේ වගකීම වේ.**

## 4. මූලික හර පද්ධතිය

4.1. ශ්‍රිලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සියලුම සාමාජිකයින්ගෙන් අපේක්ෂා කරන්නේ:

4.1.1. සෑම විටම සුපිළිපන්නභාවය, පරාර්ථකාමී කැපවීම සහ වෘත්තීය විශිෂ්ටත්වය සහිතව රාජකාරි ඉටු කිරීම .

4.1.2. මෙහෙයුම් වල ආරක්ෂාව, දැඩි විනය, ජාතික නීති සහ ජාත්‍යන්තර සමුද්‍රිය නීති සහ සම්මුතීන් වලට සම්පූර්ණ අනුකූලතාවය පවත්වා ගැනීම.

4.1.3. සෑම නිල අන්තර්ක්‍රියාවකදීම සම්පූර්ණ විනිවිදභාවය, කුසලතා සහ මූල්‍ය වගවීම ක්‍රියාත්මක කිරීම.

4.1.4. සේවාවේ අපක්ෂපාතීත්වය වෙනුවෙන් මෙහෙවරට හානි කළ හැකි ඕනෑම බැඳියාවන් අතර ගැටුම් හෝ පක්ෂග්‍රාහීත්වයක් හඳුනාගෙන ඉවත් කිරීම.

## 5. මෙම චර්යාධර්ම සංග්‍රහය අනුගමනය කල යුතු පුද්ගලයන්

5.1 ශ්‍රීලංවෙආදෙ සියලුම නිලධාරීන් සහ වෙරළ ආරක්‍ෂක පුද්ගලයින්.
5.2 කොන්ත්‍රාත්කරුවන්, සැපයුම්කරුවන් සහ අනෙකුත් තෙවන පාර්ශවීය ආයතන.
5.3 ශ්‍රීලංවෙආදෙ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලී සිටින ඕනෑම පුද්ගලයෙකු හෝ සංවිධානයක්.

## 6. අල්ලස් විරෝධී සහ දූෂණ විරෝධී ප්‍රතිපත්තිය

6.1 අල්ලස් හා දූෂණ තහනම් කිරීම. ශ්‍රීලංකා නීති පද්ධතිය යටතේ ඍජු හෝ වක්‍ර ඕනෑම ආකාරයක අල්ලස්, දූෂණ හෝ සදාචාර විරෝධී හැසිරීමක් දැඩි ලෙස තහනම් කෙරේ.
- 6.1.1. අල්ලස් ලබා දීම, පිළිගැනීම හෝ ඉල්ලා සිටීම.
- 6.1.2. රාජ්‍ය නිලධාරීන්ට පහසුකම් සැලසීමේ ගෙවීම්.
- 6.1.3. පළිගැනීම්, අයුතු ගනුදෙනු හෝ බලපෑම් අනිසි ලෙස භාවිතා කිරීම.
- 6.1.4. පෞද්ගලික වාසි සඳහා නිල තනතුරු අනිසි ලෙස භාවිතා කිරීම.

6.2 **අල්ලස් අර්ථ දැක්වීම** : අල්ලස් යනු නිල ක්‍රියාවකට හෝ තීරණයකට අනිසි ලෙස බලපෑම් කිරීම සඳහා වටිනා දෙයක් (මූල්‍යමය හෝ මූල්‍යමය නොවන) පිරිනැමීම, ලබා දීම, ලබා ගැනීම හෝ ඉල්ලා සිටීමයි.

6.3 **දේශපාලන දායකත්වයන්:** ශ්‍රිලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයින් සමඟ සම්බන්ධ වීමක් හෝ සහාය දැක්වීමක් කිසිදු ආකාරයකින් සිදු නොකරයි.

6.4 **තහනම් මූලාශ්‍ර.** වෙරළ ආරක්‍ෂක පුද්ගලයින් කිසිදු තහනම් පුද්ගලයෙක්, ආයතන හෝ ව්‍යාපාරකින් ඍජුව හෝ වක්‍රව කිසිදු තෑග්ගක්, ආගන්තුක සත්කාරයක් හෝ විනෝදාස්වාදයක් ලබානොගත යුතුය. තහනම් පුද්ගලයෙක්, ආයතන හා ව්‍යාපාරකට ඇතුළත් වන්නේ:

6.4.1 ආයතනයට නිල වශයෙන් ව්‍යාපාරික සේවාවන් සපයන ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක්;
6.4.2 ආයතනය සමඟ ගනුදෙනු කරන හෝ කටයුතු කිරීමට උත්සාහ කරන ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක්;
6.4.3 ආයතනය විසින් නියාමනය කරනු ලබන ක්‍රියාකාරකම් සිදු කරන ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක්;
6.4.4 රාජ්‍ය නිලධාරියෙකුගේ නිල රාජකාරිවලට බලපෑම් කළ හැකි මූල්‍ය බැඳීම් ඇති ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක්;
6.4.5 වෙරළ ආරක්‍ෂක පුද්ගලයින්ගේ තරාතිරම, අධිකාරිය හෝ රාජකාරි නිසා පමණක් තෑග්ගක් පිරිනමන ඕනෑම පුද්ගලයෙක්:
6.4.6 රජය විසින් තහනම් කර ඇති බවට නම් කරන ලද වෙනත් ඕනෑම ප්‍රභවයක්.

6.5 **තෑගි හෙළිදරව් කිරීම සහ පරිපාලනය. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව තුල** තෑගි හෙළිදරවු කිරීමේ කමිටුවක් තිබිය යුතු අතර, ආයතන ප්‍රධානියා විසින් නම් කරනු ලබන අවම වශයෙන් සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. තෑගි හෙළිදරව් කිරීමේ ප්‍රධානියා මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

6.6 **අනිවාර්ය හෙළිදරව් කිරීම.** ඕනෑම මූලාශ්‍රයකින් තෑග්ගක් ලබන ඕනෑම **වෙරළ ආරක්ෂක පුද්ගලයකු** එය ලැබුණු දින සිට පැය විසිහතරක් (24) ඇතුළත හෝ තම සේවා ස්ථානයට පැමිණි පසු තෑගි හෙළිදරව් කිරීමේ ප්‍රධානියා වෙත හෙළි කළ යුතුය.

6.7 **පුණ්‍ය දායකත්වයන්. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු** නාමය යටතේ සිදු කරනු ලබන පුණ්‍ය දායකත්වයන් නීත්‍යානුකූල, විනිවිද භාවයකින් සහ නිසි අනුමැතියකින් කළ යුතුය. එවැනි දායකත්වයන් දූෂිත ක්‍රියාවන් සැඟවීමට හෝ පහසුකම් සැලසීමට භාවිතා නොකරන බවට **වෙරළ ආරක්ෂක පුද්ගලයන්** සහතික විය යුතුය.

6.8 **වාර්තා තබා ගැනීම.** සියලුම ගනුදෙනු සඳහා, විශේෂයෙන් ප්‍රසම්පාදන, කොන්ත්‍රාත්තු සහ මූල්‍ය ගනුදෙනු සම්බන්ධ නිවැරදි සහ සවිස්තරාත්මක මූල්‍ය වාර්තා පවත්වා ගත යුතුය. ලැබුණු හෝ ලබා දුන් සියලුම තෑගි, ආගන්තුක සත්කාර සහ ප්‍රතිලාභ සුදුසු පරිදි ප්‍රකාශ කළ යුතුය.

## 7. ප්‍රසම්පාදනය සහ ගිවිසුම් අඛණ්ඩතාව

7.1 **සදාචාරාත්මක ප්‍රසම්පාදන පිළිවෙත්. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි** ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සාධාරණත්වය, විනිවිදභාවය සහ තරඟකාරිත්වය සමඟ සිදු කළ යුතුය. සියලුම ටෙන්ඩර් සහ ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු ශ්‍රී ලංකාවේ වත්මන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සහ ප්‍රසම්පාදන අත්පොත සහ අභ්‍යන්තර නියෝග වලට අනුකූල විය යුතුය.

7.2 **අක්‍රමිකතා වාර්තා කිරීම.** ප්‍රසම්පාදනය, කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම, භාරදීම හෝ පිළිගැනීමේදී අක්‍රමිකතා සිදුවන බවට සැක කරන හෝ දකින පුද්ගලයින් නිසි මාර්ග හරහා වහාම ඒවා වාර්තා කළ යුතුය.

## 8. තොරතුරු වාර්තා කිරීම සහ තොරතුරු වාර්තාකල හැකි පුද්ගලයන්.

8.1 **සැක සහිත කරුණු වාර්ථා කිරීම.** විෂමාචාරයක් සැක කරන ඕනෑම පුද්ගලයෙකු ඒ පිළිබඳව අණදෙන නිලධාරි හට, ජෝෂ්ඨ මාණ්ඩලික නිලධාරි(වොආපො) හෝ අභ්‍යන්තර කටයුතු ඒකකය වෙත වාර්තා කළ යුතුය.

8.2 **තොරතුරු වාර්තාකරන්නන්ගේ ආරක්ෂාව.** යහපත්කමින් ක්‍රියා කරන **තොරතුරු වාර්තාකරන්නන්ගෙන්** පළිගැනීම්, වින්දිතභාවය හෝ අහිතකර ප්‍රතිවිපාක වලින් ආරක්ෂා කරනු ලැබේ. වාර්තා රහස්‍යභාවය රකිනු ලැබේ.

8.3 **නිර්නාමික වාර්තාකරණය.** නිර්නාමික තොරතුරු ලබාදීමට විකල්ප ක්‍රම සපයා ඇති අතර, වාර්තා කරන ලද සියලුම පැමිණිලි විමර්ශනයට යටත් විය යුතුය.

**9.** **විනය ක්‍රියාමාර්ග**

9.1 **චර්යාධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීම.** මෙම සංග්‍රහයේ ඕනෑම උල්ලංඝනය කිරිමක් සුදුසු රෙගුලාසි සහ අදාළ නීතිවලට අනුකූලව විනයානුකූලව කටයුතු කෙරේ.

9.2 **චර්යාධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීම**. මෙම චර්යාධර්ම සංග්‍රහයේ ඕනෑම උල්ලංඝනයක් නාවික හමුදා නීතිය, දේශීය නීති සහ රෙගුලාසි සහ අදාළ නීතිවලට අනුකූලව විනයානුකූලව කටයුතු කිරිමට හේතු වනු ඇත.

9.2.1 අවමන් සහිතව හෝ රහිතව සේවයෙන් පහ කිරිම.
9.2.2 තරාතිමෙන් පහත හෙළීම.
9.2.3 ජ්‍යොෂ්ඨ තාවය අහිමි කිරීම.
9.2.4 තරයේ තරවටු කිරීම.

9.3 **වගවීම.** වෙරළ ආරක්ෂක පුද්ගලයින්ට මෙම චර්යාධර්ම සංග්‍රහය පිළිපැදිම සහ ක්‍රියාත්මක කිරිමට වගකීමක් ඇත. මෙය පිළිපැදිමට අපොහොසත් වීම විනය ක්‍රියාමාර්ගවලට හේතු විය හැක.

10. **පුහුණුව සහ දැනුවත්භාවය**

10.1 **අනිවාර්ය පුහුණුව.** සියලුම වෙරළ ආරක්ෂක පුද්ගලයින් මෙම චර්යා ධර්ම, අල්ලස් විරෝධී සහ දූෂණ විරෝධී පිළිවෙත් පිළිබඳ නිතිපතා පුහුණුවට භාජනය විය යුතුය. ප්‍රසම්පාදන, මූල්‍ය සහ බාහිර සම්බන්ධතා සමග නියැලී සිටින අයට විශේෂිත පුහුණුවක් ලබා දෙනු ඇත.

10.2 **දැනුවත්භාවය වැඩිදියුණු කිරීම.** අඛණ්ඩව පුහුණුව හා දැනුවත් කිරීම් මගින් සදාචාරසම්පන්න සමාජයක් බිහි කිරීමට වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව කැපවී සිටී. සදාචාරාත්මක ඇඟවීම හෝ ක්‍රියා පටිපාටි පිළිබඳව අවිනිශ්චිතතාවයක් ඇති වූ විට පැහැදිලි කිරීම් සහ මග පෙන්වීමක් ලබා ගැනීමට පිරිස් දිරිමත් කරනු ලැබේ.

**11.** **අධීක්ෂණය සහ සමාලෝචනය.**

11.1 **අධීක්ෂණ වගකීම.** අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU), අණදෙන නිලධාරීන්, ප්‍රාදේශීය අධ්‍යක්ෂවරු සහ විධායක නිලධාරීන් මෙම චර්යාධර්ම සංග්‍රහයට අනුකූල වීම නිරීක්ෂණය කර එහි කාර්යක්ෂමතාව නිතිපතා සමාලෝචනය කළ යුතුය.

11.2 **විගණන සහ තක්සේරු කිරීම්.** මෙම චර්යාධර්ම සංග්‍රහය ක්‍රියාත්මක කිරීම ඇගයීමට සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට වරින් වර විගණන සහ අවදානම් තක්සේරු කිරීම් පවත්වනු ලැබේ.

11.3 **සංශෝධන සහ යාවත්කාලීන කිරීම්.** නීති, රෙගුලාසි හෝ සංවිධානාත්මක ප්‍රමුඛතා වල වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා මෙම චර්යාධර්ම සංග්‍රහය වරින් වර සංශෝධනය කළ හැකිය. යාවත්කාලීන කිරීම් ඒ අනුව සියලුම පුද්ගලයින්ට දැනුම් දෙනු ලැබේ.

## 12. **අවසාන ප්‍රකාශය .**

ජාතියට ගෞරවය , සුපිළිපන්න සේවය සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි දැඩි කැපවීම පිළිබිඹු කරයි . මෙම වටිනාකම් ආරක්ෂා කිරීම සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විශ්වාසදායක සහ ගෞරවනීය ආයතනයක් ලෙස පැවතීම සහතික කිරීම සඳහා සෑම වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයෙකුම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

මෙම ආචාර ධර්ම සංග්‍රහය පිළිපැදීමෙන් , වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි සෑම සාමාජිකයෙකුම ශ්‍රීලංකාවේ ජනතාවට ගෞරවයෙන් හා අවංකව සේවය කිරීම සඳහා වන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙ හි හවුල් මෙහෙවර ශක්තිමත් කරයි.